# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2444/14 - 2025 ජූලි මස 08 වැනි අඟහරුවාදා - 2025.07.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය:* DSO/HOM/LAC/132.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර*:

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කහතුඩුව ගමේ මැනුම්පති විසින් පිළියෙල කර ඇති අංක 520037-05-09 සහ 2024.10.03 දිනැති කැඩැස්තර සිතියමේ කැබලි අංක 2 , 3, 5 වශයෙන් පෙන්නුම් කෙරෙන මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.0924 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි.

01. කැබලි අංක **02**
ඉඩමේ නම: ශ්‍රී සුමණ මාවත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.01052.

02. කැබලි අංක **03**
ඉඩමේ නම: දොඹගහවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ශ්‍රී සුමන පුෂ්පිකාරාමවාසී ශ්‍රී සුමන පුෂ්පිකාරාමයේ විහාරාධිපති උඩවෙල සෝමානන්ද හිමි; ප්‍රමාණය: හෙක්. 0.0051.

03. කැබලි අංක **05**
ඉඩමේ නම: මිත්‍ර ගංකන්ද මාවත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0768.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් 2025 ඔක්තෝබර් මස 01 වැනි දින පෙ.ව. 10.00 ට හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2025 සැප්තැම්බර් මස 25 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

බී. ඒ. ඩී. චින්තක,
ප්‍රාදේශීය ලේකම්,
හෝමාගම.

2025 ජූලි මස 03 වැනි දින,
හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 07-0078


1A - G 044768 – 07 (2025/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*